සැ. යු. - 2017.02.23 වැනි දින පළ වූ අංක 2008 දරන ගැසට් පත්‍රයේ II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,009 - 2017 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2017.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 428 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 430 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 431 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 437 |


සැ. යු. -(i) හෙක්ටර් අප්පුහාමි හෙල්පින් හැන්ඩ් පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 මාර්තු මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මාර්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### මිල ගණන් කැඳවීමයි

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2017***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2017.03.21 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාරගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| දකුණු පළාත | මාතර | කඹුරුපිටිය | පළාත් සර්වේයර් ජනරාල් (දකුණු පළාත) පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ගාල්ල | කඹුරුපිටිය අවට | 2017.04.01 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත්කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලියුම් කවරයේ ඉහල වම් කෙළවරෙහි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාල ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2017.03.21 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

2017 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

*ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2017*

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2017**

*ගොඩනැගිල්ල අයිතිකරුගේ :*

1. සම්පූර්ණ නම : ____________.
2. ලිපිනය : ____________.
3. දුරකථන අංකය : ____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : ____________.

*ගොඩනැගිල්ල :*

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : ____________.
2. මාසික කුලී මුදල : ____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : ____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : ____________.
5. භූමියේ විශාලත්වය : ____________.

6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: ____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : ____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : ____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/) : ____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : ____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මවිසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

____________.
අයදුම්කරුගේ අත්සන.

03-110

---

**මහාධිකරණය - හලාවත**

රාජසන්තක කරන ලද වාහන ටෙන්ඩර් මගින් විකිණීම - 2017

හලාවත මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පුත්තලම මහාධිකරණය සහ හලාවත දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රථවාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබ්. අදළ ටෙන්ඩර්පත් 2017.03.06 සිට 2017.03.14 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.30 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ හලාවත මහාධිකරණ කාර්යාලයේ දී උපලේඛනයේ දක්වා ඇති තැම්පත් මුදල් ගෙවා ලබාගත හැකි ය. ඒ සමග ටෙන්ඩරයට අදළ අනිකුත් සියලු විස්තර ලියකියවිලි සහ කොන්දේසි ඔබට ලබාදීමට නියමිතය.

උපලේඛනය

*දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හලාවත*

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන වර්ගය* | *විශේෂ කරුණු* | *ලි. ප. අංකය* | *ආපසු ගෙවන ගාස්තුව රු.* | *ආපසු නොගෙවන ගාස්තුව රු.* |
|---|---|---|---|---|---|---|
| 01. | 67348 | Isuzu වර්ගයේ ලොරි රථය | අයිතිය පැවරීම සම්බන්ධයෙන් ලිපිලේඛන ලබා දිය නොහැක. | 28 ශ්‍රී 7203 | 5,000 0 | 200 0 |
| 02. | 75199 | ටාටා වර්ගයේ ලොරි රථය | | 41 ශ්‍රී 8758 | 5,000 0 | 200 0 |
| 03. | 70054 | Mitsubishi වර්ගයේ ලොරි රථය | | 41-2307 | 5,000 0 | 200 0 |
| 04. | 56674 | Mitsubishi වර්ගයේ ලොරි රථය | පවතින ලියාපදිංචි අංක යටතේ ම නව ලියාපදිංචිය සිදු කළ හැක. | 226-9411 | 5,000 0 | 200 0 |
| 05. | 71294 | Bajaj වර්ගයේ ත්‍රිරෝද | | NWYT 4339 | 5,000 0 | 200 0 |

අනු අංක 01 සිට 04 දක්වා වාහන හලාවත දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී පරීක්ෂාකර බැලිය හැක. අනු අංක 05 යටතේ ඇති වාහනය හලාවත පොලිස් ස්ථානයේ දී පරීක්ෂා කර බැලිය හැක.

**මහාධිකරණය පුත්තලම**

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන වර්ගය* | *ලි. ප. අංකය* | *ආපසු ගෙවන ගාස්තුව රු.* | *ආපසු නොගෙවන ගාස්තුව රු.* |
|---|---|---|---|---|---|
| 06. | Hc 07/2014 | Daihatsu ලොරි රථය | NWLF -5520 | 5,000 | 200 |

අනු. අංක 06 යටතේ ඇති වාහනය පුත්තලම මහාධිකරණයේ දී පරීක්ෂා කර බැලිය හැක.

එන්. වී. කරුණාතිලක,
මහාධිකරණ විනිසුරු,
වයඹ පළාත්බද මහාධිකරණය,
හලාවත.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
හලාවත මහාධිකරණයේ දී ය.

03-138

---

# බඩු බාහිරාදිය විකිණීම්

## පොලිස් අධිකාරි කාර්යාලය - නුගේගොඩ

### නුගේගොඩ කොට්ඨාසයේ මිරිහාන දිසා බඩු ගබඩාවේ අබලි භාණ්ඩ වෙන්දේසිය

නුගේගොඩ කොට්ඨාසයේ පොලිස් කාර්යාල සහ පොලිස් ස්ථානවල පාවිච්චි කරන ලද දැනට පාවිච්චියට ගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් අබලි භාණ්ඩ 2017.03.09 වැනි දින පෙරවරු 10.00 ට මිරිහාන පොලිස් ක්‍රීඩා භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එසේ වෙන්දේසිවන භාණ්ඩ ගැනුම් කරුවන් විසින් මුදල් ගෙවා එවේලේ ම වෙන්දේසි භූමියෙන් ඉවත්කර ගත යුතු අතර භාණ්ඩ ලබාගන්නා ගැණුම්කරුවන් විසින් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය. 2017.03.08 පැය 1300 සිට පැය 1600 දක්වා වෙන්දේසි භූමියේ දී භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකි ය.

ප්‍රසාද් රණසිංහ,
පොලිස් අධිකාරි,
නුගේගොඩ කොට්ඨාසය.

**උපලේඛනය**

| | | *ප්‍රමාණය* |
|---|---|---|
| 01. | යකඩ කුෂන් පුටු | 231 |
| 02. | ලාච්චු කැබිනට් | 04 |
| 03. | යකඩ සහ ලී මේස | 03 |
| 04. | ලොකු වානේ කබඩ් | 11 |
| 05. | විධායක පුටු | 04 |
| 06. | වර්ණ රූපවාහිනී | 10 |
| 07. | පංචර් | 28 |
| 08. | ටියුබ් ලයිට් කේස් | 17 |
| 09. | වායු සමීකරණ | 01 |
| 10. | ටියුබ් ලයිට් සෙට් | 57 |
| 11. | ටෝච් | 15 |
| 12. | ඇන්ටනා සහ බූස්ටර් | 01 |
| 13. | ස්ටෙපර් මැෂින් | 16 |
| 14. | ඩෙක් යන්ත්‍ර | 01 |
| 15. | යකඩ රාක්ක | 04 |
| 16. | යතුරු තහඩු | 02 |
| 17. | සිංහල යතුරු ලියන (වර්ගය අපැහැදිලියි) | 30 |
| 18. | ඉංග්‍රීසි යතුරු ලියන | 04 |
| 19. | ඉලෙක්ට්‍රික් ඉංග්‍රීසි යතුරු ලියන | 01 |
| 20. | පාපැදි | 49 |
| 21. | පාපැදි ෆ්‍රේම් සහ අමතර කොටස් | 04 |
| 22. | විදුලි කේතල | 04 |
| 23. | වතුර පිල්ටර් | 19 |
| 24. | වතුර බොයිලේරු | 11 |
| 25. | සිවිලින් විදුලි පංකා (විවිධ වර්ගයේ) | 39 |
| 26. | මේස විදුලි පංකා (විවිධ වර්ගයේ) | 09 |
| 27. | සිටුවන විදුලි පංකා (විවිධ වර්ගයේ) | 04 |
| 28. | ප්‍රින්ටර් | 05 |
| 29. | පරිගණක බැටරි (UPS) | 07 |
| 30. | වතුර මෝටර් | 01 |

| | | ප්‍රමාණය |
|---|---|---|
| 31. | පරිගණක (CPU) | 01 |
| 32. | මවුස් | 13 |
| 33. | කීබෝඩ් | 07 |
| 34. | පැක්ස් මැෂින් | 07 |
| 35. | පරිගණක ස්පීකර් | 02 |
| 36. | මොනිටර් | 05 |
| 37. | ගැල්වනයිස් බාල්දි | 16 |
| 38. | උදළු තල | 05 |
| 39. | රේක්ක | 02 |
| 40. | ගෑරුප්පු | 02 |
| 41. | විසිකැති | 02 |
| 42. | කතුරු | 02 |
| 43. | අගල් 34 කල්දේරම් | 04 |
| 44. | මේස පිහි | 08 |
| 45. | ඇළුමිනියම් ජොග්ගු | 21 |
| 46. | කොරොස් | 01 |
| 47. | හදිසි ලාම්පු ගුවන් විදුලි යන්ත්‍රය සමග | 01 |
| 48. | දම්වැල් | 01 |
| 49. | ඉබි යතුරු | 120 |
| 50. | ගිනි නිවන උපකරණ | 02 |
| 51. | ගුවන් විදුලි යන්ත්‍ර | 01 |
| 52. | ඇළුමිනියම් නැඹිලි | 01 |
| 53. | සවල් | 01 |
| 54. | ඇන්ටනා බට | 01 |

| | | ප්‍රමාණය |
|---|---|---|
| 55. | සාස්පාන් (විවිධ ප්‍රමාණයේ) | 24 |
| 56. | කියත් තල | 05 |
| 57. | මේස හැඳි | 15 |
| 58. | බිත්ති ඔරලෝසු | 08 |
| 59. | ඇළුමිනියම් බේසම් | 07 |
| 60. | පොරෝතල | 04 |
| 61. | මල්ටිපොට් | 03 |
| 62. | බිත්ති විදුලිපංකා | 02 |
| 63. | හීටර් | 01 |
| 64. | කේතල් | 03 |
| 65. | පේපර් කටර් | 01 |
| 66. | රෝනියෝ යන්ත්‍ර | 01 |
| 67. | මල්කපන කතුරු | 01 |
| 68. | භූමිතෙල් කරඩි | 02 |
| 69. | වානේ කබඩ් (භාග) | 01 |
| 70. | ගෑස් ලාම්පු | 01 |
| 71. | ගෑස් ලිප් | 01 |
| 72. | ස්පීකර් සෙට් | 01 |
| 73. | මේස ලාම්පු | 03 |
| 74. | සැරිකන් ලාම්පු | 04 |
| 75. | මිනුම් ජෝගු | 01 |
| 76. | කාර්යාල පුටු | 11 |
| 77. | ස්පැනර් | 02 |
| 78. | බන්දේසි | 02 |

03-46

---

# රජයේ නොවන දැන්වීම්

## සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : එන්විරෝටෙච් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 118130
සංස්ථාගත කළ දිනය : 2016.11.21
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 521 1/1, මීගමුව පාර, පෑලියගොඩ.

ජේ. එම්. ඩී. ආරියරත්න, (වරලත් ගණකාධිකාරී),
සමාගමේ ලේකම්.

03-23

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : පීකොක් විලා මිරිස්ස (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : උළුවප්ජගොඩවත්ත, උඩුපිල, මිරිස්ස.
සංස්ථාගත කළ දිනය : 2017 පෙබරවාරි 01 වැනි දින
ලියාපදිංචි අංකය : පී වී 119780

සමාගම් ලේකම්.

03-25

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

අලුබෝමුල්ල, අරුග්ගොඩ ග්‍රීන්විලේජ් හි අංක 444/36 පදිංචි නිහාල් විතානගේ ජා. හැ. අ. 63100804V වන මා විසින් ඉහත ලිපිනයේ පදිංචි දෝන රේණුකා ප්‍රියදර්ශනී යන අයට දිනපොත් අංක 12359 යටතේ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩී. කරුණාතිලක මහතා විසින් 2007.11.23 වැනි දින ඇටර්නි බලය 2017.02.10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

නිහාල් විතානගේ.

03-29

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව එස් කේ යූ මෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනය 2016 දෙසැම්බර් මස 19 වැනි දින සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එස් කේ යූ මෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 118786
ලියාපදිංචි කාර්යාලය : අංක 138/2, හයිලෙවල් පාර, කොට්ටාව, පන්නිපිටිය

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි.

03-31

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව ඉන්දික ප්ලයිවුඩ් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය 2016 ජූලි මස 11 වැනි දින සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඉන්දික ප්ලයිවුඩ් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 114947
ලියාපදිංචි කාර්යාලය : අංක 272/ඒ/1, හයිලෙවල් පාර, වටරැක පාදුක්ක.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි.

03-32

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව ඒ පී එන් ඩී එස් පොලි පැකේජිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනය 2016 ඔක්තෝබර් මස 17 වැනි දින සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඒ පී එන් ඩී එස් පොලි පැකේජිං (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 117299
ලියාපදිංචි කාර්යාලය : අංක 80, මාලපල්ල, පන්නිපිටිය.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි.

03-33

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : සෙන්ටෝරස් ඔන්ලයින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 112646
ලියාපදිංචි දිනය : 2016 මාර්තු 24
ලියාපදිංචි ලිපිනය : 2 වන මහල, අංක 275, නාවල පාර, නාවල.

03-34

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම 2016.01.27 දින සංස්ථාපනය කරන ලද බව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ග්ලෝබල් ඇග්‍රෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 111522
ලිපිනය : අංක 14, බන්ගලාවත්ත, මාබෝල, වත්තල.

ලේකම්.

03-41

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම 2016.05.04 දින සංස්ථාපනය කරන ලද බව නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : මෙයින්ස් ලංකා ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 113428
ලිපිනය : අංක A/F1/u19 සියසෙත සෙවන, පංචිකාවත්ත පාර, කොළඹ 10.

ලේකම්.

03-42

## ඇටර්නි බලය අවලංගු කිරීම

148/7, 4 වන පටුමග උයන ලුනාව මොරටුව පදිංචි පාලමණ්ඩඩීගේ නිලංක ලක්ෂාන් ප්‍රනාන්දු ජා. හැ. අංකය 822022561 V වන මම, මා කියා සිටින්නේ 148/7, 4 වන පටුමග උයන, මොරටුව පදිංචි පාලමණ්ඩඩීගේ නිමල් ප්‍රනාන්දු ජා. හැ. අංකය 582712450 V යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරමින් ප්‍රසිද්ධ නොතාරිස් අයොනි බිමල්කා පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 654 සහ 2009.07.25 වැනි දින දෙන ලද ඇටෝර්නි බලපත්‍රය 2017.02.08 සිට බල නොපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

නිලංක ලක්ෂාන් ප්‍රනාන්දු.

03-47

---

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

හෝකන්දර, සමගි මාවතේ, ඊඩ්න් ගාර්ඩ්න්ස් , අංක 72 හි පදිංචි අදිකාරම් ජයසූරිය මුදියන්සේලා ඡන්දන බණ්ඩාර (ජා. හැ. අංක 833053434 V) විසින් රාජගිරිය නාවල, ගල්පොත්ත පාර, අංක 42/3 හි පදිංචි දිනේෂ් සංජීව් මිචෙල් (ජා. හැ. අංක 832800910 V) යන අයව පත් කරන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. පී. ජේසුදසන් මහතා විසින් 2013.02.08 වැනි දින ලියා සහතික කරන ලද 1097 දරන ඇටෝර්නි බලපත්‍රය 2017.02.08 වැනි දින සිට අවලංගු කර බලරහිත කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයේ මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

දිනේෂ් සංජීව් මිචෙල්.

2017 පෙබරවාරි මස 8 වැනි දින දී ය.

03-54

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : නාමල් බාලචන්ද්‍ර ක්‍රියේෂන්ස් (පුද්ගලික) සමාගම
සමාගම් අංකය : පී වී 101423
ලියාපදිංචි කළ දිනය : 2014.10.13
සමාගම් ලිපිනය : වදුරාමුල්ල වත්ත, කිරිබේරිය පාර, පානදුර.

සමාගම් ලේකම්.

03-55

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : යුනික් ඉන්ඩස්ට්‍රියල් සොලුෂන්ස් (පුද්ගලික) සමාගම
සමාගම් අංකය : පී වී 116150
ලියාපදිංචි කළ දිනය : 2016.08.31
සමාගම් ලිපිනය : අංක 1/467, ගාලු පාර, කළුතර දකුණ.

සමාගම් ලේකම්.

03-56

---

## දැන්වීමයි

බ්‍රැන්ඩික්ස් ටෙක්ස්ටයිල්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් (පී බී 824) බ්‍රැන්ඩික්ස් මර්කරි ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 74530) ස්ටිවන්සන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 6839), බ්‍රැන්ඩික්ස් ඩිසයින් සොලුයූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී බී 792 පී වී) බ්‍රැන්ඩික්ස් ලයිට්සෝ ලිමිටඩ් (පී බී 88) සහ බ්‍රැන්ඩික්ස් හැන්ගර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 13002) කුරුවිට ටෙක්ස්ටයිල් මිල්ස් ලිමිටඩ් (පී කියු 176/පීවී) සමග ඒකාබද්ධ කිරීම.

2007 අංක 07 දරන සමාගම් ආඥපනතේ 242 (2) ප්‍රකාර ඉහත කී සමාගම් එකම නෛතික ආයතනයක් බවට පත්වන බවටත්, එය කුරුවිට ටෙක්ස්ටයිල් මිල්ස් ලිමිටඩ් (පී කියු 176/පීවී) නමින් ඉදිරියට ක්‍රියාත්මක වන බවටත් ඉහත සඳහන් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් සම්මුතියකට එළඹ ඇත. මෙම ඒකාබද්ධ කිරීම 2017 මාර්තු 15 වැනිද හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන දිනයක සිට බල පැවැත්වේ.

බ්‍රැන්ඩික්ස් ටෙක්ස්ටයිල්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්, බ්‍රැන්ඩික්ස් මර්කරි ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්, ස්ටිවන්සන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, බ්‍රැන්ඩික්ස් ඩිසයින් සොලුයූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, බ්‍රැන්ඩික්ස් ලයිට්සෝ ලිමිටඩ්, බ්‍රැන්ඩික්ස් හැන්ගර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩලයන් හි අණ පරිදි,

බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

03-70

## ඇටෝර්නි බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ නිවේදනය

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ඒ සිතම්පරප්පිල්ලෙයි විසින් 2012 සැප්තැම්බර් මස 25 වැනි දින සහතික කරන ලද කිළිනොච්චි කරඩිපොකු හංදිය, එමර්සන් පාරේ පදිංචි විසුවනාදන් කදිරවේලු යන අය වෙත ප්‍රදානය කරන ලද අංක 329 දරන 2012 ඔක්තෝබර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය යටතේ මින්මතුවට කරන යම් කවරම වූ ගණුදෙනුවක් සඳහා මා වගකීමක් නොදරන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 03, කොල්ලුපිටිය, ධර්මපාල මාවතේ, අංක 9 දරන ස්ථානයේ පදිංචි ශ්‍රීරන්ජනී පූලෝගසුන්දරම් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ශ්‍රීරන්ජනී පූලෝගසුන්දරම්.

03-103

---

## ප්‍රසිද්ධ නිවේදනය

සීමිත වගකීම් සහිත සමාගම් සංස්ථාපනය කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : බෙලී ලිවිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 119652
සංස්ථාපිත දිනය : 2017 ජනවාරි මස 27 වැනි දින
ලියාපදිංචි කාර්යාල ලිපිනය : 18 ගැමුණු මාවත, බොරුපන පාර, රත්මලාන.

පී ඩබ්ලිව් කෝපරේට් සෙකටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්.

03-108

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය අනුව වගකීම් සීමාසහිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි.

සමාගමේ නම : ඒ ආර් එල් එලිවේට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 119753
සංස්ථාගත කළ දිනය : 2017 ජනවාරි මස 31 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 278, යූනියන් පෙදෙස, කොළඹ 02.

පී. ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

03-109

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් මල්ලව ආරච්චිගේ ශානිකා ලක්මිණි මල්ලවආරච්චි විසින් 2014 ජූලි මස හතරවන (04) දින සහතික කරන ලද අංක 21 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් රාගම, හොරපේ, පන්සල පාර, අංක 49/2/1/ඒ දරන ස්ථානයේ පදිංචි මතුගමගේ දෙන් ජයතිස්ස (ජා. හැ. අංක 482561306 වී හිමි) වන මා විසින් රාගම, හොරපේ, පන්සල පාර අංක 49/2/1 ඒ දරන ස්ථානයේ පදිංචි මතුගමගේ දොන් රුවනි ඉරෝෂිනි මතුගම (ජා. හැ. අංක 898303837 වී) යන අය වෙත පවරා දෙන ලද අටර්නි බලතල මෙයින් සම්පූර්ණයෙන් අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

තවද, එකී මතුගමගේ දොන් රුවනි ඉරෝෂිනි මතුගම විසින් එකී ඇටර්නි බලපත්‍රය මත සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මෙයින් පසු මා විසින් කිසිදු වගකීමක් නොදරන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මතුගමගේ දොන් ජයතිස්ස.

03-119

---

## දැන්වීමයි

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

සමාගමේ නම : මරුති කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119808
ලියාපදිංචි කළ දිනය : 2017 පෙබරවාරි 2
ලියාපදිංචි කාර්යාලය : අංක 140/1, සී ස්ට්‍රීට්, මීගමුව.

සමාගම් ලේකම්.

03-131

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 දරන වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී

සමාගමේ නම : ස්කයිහෝක් ඉන්ස්ටිටියුට් ඔෆ් ඒරෝනෝටිකල් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119773
ලියාපදිංචි කළ දිනය :2017.02.02
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 29, තිඹිරිගස්කටුව, මීගමුව.

නීතිඥ ටී. සී. වීරසිංහ,
සමාගම් ලේකම්.

අංක 165, කිරුළ පාර,
කොළඹ 05.

03-139

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාතර, කඹුරුගමුව, තල්අරඹ ''විජය'' හි පදිංචි, පියදිගමගේ ජයවීර වන මා විසින්, බොරලැස්ගමුව, රුබන් පෙරේරා මාවත, අංක 149හි පදිංචි පියදිගමගේ ජයසූරිය යන අය වෙත බලය පවරමින්, ප්‍රසිද්ධ නොතාරිස් සිසිර රංගජීව ගමගේ මහතා විසින් වර්ෂ 2007.10.01 වැනි දින ලියා සහතික කරන ලද අංක 716 දරන ඇටර්නි බලපත්‍රය 2017.02.13 වැනි දින සිට අවලංගු කරන බවත්, එකී ඇටර්නි බලකරු ලෙස සිදුකරන කිසිදු ක්‍රියාවන්ට මා හට වගකීමක් නොමැති බව ද මෙයින් දැනුම් දෙමි.

පියදිගමගේ ජයවීර.

03-161

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

මෙහි පහත අත්සන් කරන සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රක්වාන, කන්ද කුඹුර, අංක 02 හි පදිංචි කරුප්පන්නන් බාලකුමාර් වන මා විදේශගත වීමට පෙර රක්වාන ප්‍රසිද්ධ නොතාරිස් ජී. ආර්. ජී. අනුරුද්ධ ජයසේකර මහතා විසින් ලියා සහතික කරන ලද අංක 215 සහ වර්ෂ 2016 ක් වූ පෙබරවාරි මස 15 වැනි දින දරන ඇටෝර්නි බලකරයෙන් රක්වාන කෙලින් වීදිය, අංක 66/1 දරන ස්ථානයේ පදිංචි තේවේන්ද්‍ර රාජා සුගනියා යන අය වෙත බලය පවරන ලදී. එසේ පවරා දෙන ලද ඇටෝර්නි බලය අද දින සිට ප්‍රසිද්ධ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙසේ දැනුම් දෙමි. ඇය විසින් මා වෙනුවෙන් එළඹෙනු ලබන කවර හෝ ගනු දෙනුවකට අද දින සිට මා වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

2017ක් වූ ජනවාරි මස 25 වැනි දින දී ය.

03-179

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය ප්‍රකාර සමාගමේ නම වෙනස් කිරීම.

පෙර නම : ත්‍රිශූල් අවුට්ඩෝ ඇඩ්වර්ටයිසිං සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 64867
ලියාපදිංචි ලිපිනය : අංක 10, ඇසල ක්‍රීඩාභූමිය පාර, ඔබේසේකර පුර, රාජගිරිය
අළුත් නම : ත්‍රිශූල් ඉන්ටග්‍රේටඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
නම වෙනස් කිරීමේ දිනය : 2017 ජනවාරි 16 වැනි දින.

සමාගමේ ලේකම්වරු.

03-187

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : තරංග මෝටර් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119779
ලියාපදිංචි ලිපිනය : අංක 26, සැතපුම් කණුව, කලල්පිටිය, නිට්ටඹුව
සංස්ථාගත කළ දිනය : 2017 පෙබරවාරි 01

සමාගම් අධ්‍යක්ෂක.

03-188

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ද ලෙයොන් කැෆේ ඇන්ඩ් රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 119826
ලියාපදිංචි ලිපිනය : අංක 68/ඒ/8, නුවර පාර, වේවැල්දෙනිය.
සංස්ථාගත කළ දිනය : 2017 පෙබරවාරි මස 02

සමාගම් අධ්‍යක්ෂක.

03-189

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගොතටුව බෝපැත්ත අංක 291/1 බී පදිංචි ඉන්දික රාමනායක (ජා. හැ. අංක 663184083 වී) විසින් කොෂිබා ෆිනැන්ස් පුද්ගලික සමාගම ඇටෝනි බලකරු වශයෙන් පත්කරමින් පිළියෙල කළ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. ඩබ්ලිව්. උදය කුමාර විසින් 2016.11.18 වැනි දින ලියා සහතික කරන ලද අංක 311 දරන ඇටෝනි බලපත්‍රය 2017.02.04 දින සිට බලපැවැත්වෙන සේ මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර මින්මතු එකී ඇටෝනි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ද සියල්ලන් වෙත මෙයින් දැනුම් දෙමි.

03-192

## නිවේදනයයි

පහත සඳහන් සමාගමේ කොටස්, 2016 දෙසැම්බර් මස 30 වැනි දින සිට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කිරීම හේතුවෙන් එකී සමාගමේ තත්ත්වය වෙනස් වීම මත, එහි නාමය පහත පරිදි වෙනස්වන බව, 2007 අංක 7 දරන සමාගම් පනතේ 11(5) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරන සිටිමු.

සමාගමේ කලින් නම : මෙල්ස්ටකෝප් ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 11755 පී බී
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10
සමාගමේ අලුත් නම : මෙල්ස්ටකෝප් පීඑල්සී

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පී වී ටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

03-206

## ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

2013 ජූලි මස 15 වන දින එම්. එම්. ස්වර්ණලතා ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 454 දරන ඇටර්නි බලපත්‍රය මගින් කඩුවෙල, කොරතොට, මැණිකාගාර පාර, අංක 336/12 දරන ස්ථානයේ පදිංචි කපුගමගේ රෝහිත කරුණාරත්න (ජාතික හැඳුනුම්පත් අංක 622241404 වී) මහතාට එම ලිපිනයට ම අයත් (ජාතික හැඳුනුම්පත් අංක 756052756 වී) විජේන්ද්‍ර ගම්ලත්ලාගේ චමිලා කුමාරි දේවසුරේන්ද්‍ර මහත්මිය විසින් දෙන ලද ඇටර්නි බලපත්‍රය 2017 පෙබරවාරි මස 17 වැනි දින අහෝසි කරන බව දන්වා සිටිමි. මෙයින් පසු කරන ලද ගනුදෙනු වෙනුවෙන් මා කිසිම සම්බන්ධතාවයක් නැති බවට මෙ මගින් මහජනතාවටත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් දන්වා සිටිමි.

විජේන්ද්‍ර ගම්ලත්ලාගේ චමිලා
කුමාරි දේවසුරේන්ද්‍ර.

03-207

## දැන්වීමයි

2007 අංක 7 දරනන ආඥපනතේ 9 (2) වගන්තිය යටතේ ඒෂියා පැසිෆික් බෲවරි (ලංකා) ලිමිටඩ් යන නාමය හයිනෙකෙන් ලංකා ලිමිටඩ් වශයෙන් වෙනස් කර වර්ෂ 2017.02.13 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ පෙර නම : ඒෂියා පැසිෆික් බෲවරි (ලංකා) ලිමිටඩ්
සමාගමේ අංකය : පීබී 910
ලියාපදිංචි ලිපිනය : අංක 260, ග්‍රීන් හවුස්, නාවල පාර, නාවල
සමාගමේ පසු නම : හයිනෙකෙන් ලංකා ලිමිටඩ්
සමාගම් ලේකම් : සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

03-144

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමෙ නම : චමී රයිස් මිල්ස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ අංකය : පී වී 119757
ලියාපදිංචි කාර්යාලය : අංක 31, යෝධ ඇල, හිඟුරක්ගොඩ
ලියාපදිංචි දිනය : 2017.02.01

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (පී වී ටී) එල්ටීඩී.

03-152

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමෙ නම : දිනේවරා ඉන්වෙස්ට්මන්ට් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ අංකය : පී වී 119858
ලියාපදිංචි කාර්යාලය : වැගොල්ල පාර, ඉහල මාවිල, නාත්තන්ඩිය
ලියාපදිංචි දිනය : 2017.02.03

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (පී වී ටී) එල්ටීඩී.

03-153

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමෙ නම : එම් පී ලංකා ඩිස්ට්‍රිබියුටර්ස් (පී වී ටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 119769
ලියාපදිංචි කාර්යාලය : අංක 671/1,කොහල්විල පාර, දළුගම, කැලණිය
ලියාපදිංචි දිනය : 2017.02.01

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (පී වී ටී) එල්ටීඩී.

03-154

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : පොන්ටස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 119971
ලියාපදිංචි කළ දිනය : 2017 පෙබරවාරි මස 08
ලියාපදිංචි කාර්යාලය : පළමු කුළුන, අංක 31 ඒ 1, 320, යුනියන් පෙදෙස, කොළඹ 02.

03-156

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මදුරන්කුලි ගමේ, මහ-කුඹුක්කඩවල පාරේ පිහිටි උනවැලි කානි හෙවත් පත්තායම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඕ. එම්. නජීබ් විසින් මැන සාදන ලද අංක 5026 ඒ සහ 2013.01.14 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 1 දරන බිම් කොටස

ප්‍රමාණය : (අ. 1, රූඩ් 3, පර්. 24.20) අක්කර එකකුත් රූඩ් තුනක් පර්චස් විසි හතරයි දශම දෙකයි බිංදුවක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේ සමගය.

ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1263 සහ 2010.09.24 දින දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව ඉහත උපලේඛනය හි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය බන්ධනදයි වශයෙන් සුමිත් කොයර් ෆයිබර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය උකස්කරු වශයෙන්, කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනදයී විසින් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2017ක් වූ මාර්තු මස 22 වැනි දින පෙ. ව. 11.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - මදුරන්කුලිය සිට මීටර් 300ක් පමණ හලාවත පාරේ ගමන් කර වමට හැරී එතැන් සිට මහකුඹුක්කඩවල පාරේ මීටර් 600ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ පාරේ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ඉතිරි සියයට අනුව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී, අංක 46/58, නවම් මාවත, කොළඹ 02. දුරකථන අංකය 011-4218745.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්
කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංකය : 077-3181891.

03-185

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ නුවර දෙඩන්වල ගමේ පිහිටි වරිපනම් අංක 11/2 ඊ දරන ගල්කන්ද එස්ටේට් නමැති ඉඩමට, බලයලත් මිනින්දෝරු එස්. එම්. අබේරත්න විසින් මැන සාදන ලද අංක 1369 සහ 1996.10.10 දින දරන පිඹුර ප්‍රකාර බෙදවෙන් කරන ලද කැබැලි අංක ඒ දරන බිම් කොටස,

ප්‍රමාණය : (අ. 0, රූඩ් 1, පර්. 20) රූඩ් එකයි පර්චස් විස්සක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේ සමගය.

මෙම දේපළ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 442/140 දරන වෙලුම්/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත. තව ද, ඉහත කී ඉඩමට මෙහි පහත විස්තර කරන ඉඩමෙන් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ, නුවර දොඩන්වල ගමේ පිහිටි, ගල්කන්ද එස්ටේට් නමැති ඉඩමට, බලයලත් මිනින්දෝරු එස්. එම්. අබේරත්න විසින් මැන සාදන ලද අංක 1369 සහ 1996.10.10 දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද කැබලි අංක බී දරන බිම් කොටස.

ප්‍රමාණය : (අ. 0, රූඩ් 0, පර්. 5.2) පර්චස් පහයි දශම දෙකක් විශාල ඉඩම් කැබැල්ල. මෙම දේපළ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 442/141 දරන වෙළුම/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. රෝමනී තලවත්ත විසින් සහතික කරන ලද අංක 49 සහ 2012.04.05 දින දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය බන්ධනදයි වශයෙන් ටෙලි-ෆික්ස් ටෙක්නොලිජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදයි වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනදයි විසින් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2017ක් වූ මාර්තු මස 20 වැනි දින පෙ. ව. 11.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - නුවර සිට අනිවත්ත දෙසට අනිවත්ත පාරේ ඇති බිංගෙය පසුකර කිලෝමීටර 2ක් පමණ ගමන් කළ විට දකුණට ඇති ගල්කන්ද පාරේ ගමන් කර බෝධිරුක්කාරාම පාරේ මීටර් 700ක් පමණ ගමන් කර බෝධිරුක්කාරාම පන්සල අසළින් වමට ඇති තාර දමා ඇති වාහන ගමන් කළ හැකි පාරේ (පුද්ගලික පාර) තවත් මීටර් 25ක් පමණ ගමන් කළ විට අදළ දේපළ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ඉතිරි සියයට අනුව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී අංක 46/58, නවම් මාවත, කොළඹ 02.
දුරකථන අංක 011-4218745.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩ්‍රොෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 077-3181891.

03-184

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභා සීමාව තුළ බොරැල්ලේ පිහිටි පාර පුළුල් කිරීමට පසුව බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1757 සහ 1985.02.09 දින දරන පිඹුර ප්‍රකාර බෙදු වෙන් කළ කැබලි අංක ඒ 2 දරන බිම් කොටසේ නැවත මැන බෙදීමක් වන වර්තමානයේ ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතේ (කලින් කොටා පාර) වර්තමානයේ අංක 60 ඒ දරන බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 5080/9000 සහ 2008.08.19 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදු වෙන් කරන ලද කැබලි අංක ඒ2ඒ,

*ප්‍රමාණය* : (අ. 0, රූඩ් 0, පර්. 7.66) පර්චස් හතයි දශම හයයි හයක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සැම සියලු දේ සමගය.

ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. පී. එස්. කරුණානායක විසින් සහතික කරන ලද අංක 4200 සහ 2011.08.26 දින දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය බන්ධනදයි වශයෙන් බෝදහන්දි ලොයිඩ් ජිනරන්ජන් ද සිල්වා යන අය බන්ධනදයි වශයෙන්, කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනදයි විසින් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2017ක් වූ මාර්තු මස 21 වැනි දින පෙ. ව. 10.00 ට අදළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - බොරැල්ල සිට කොටා පාර ඔස්සේ වර්තමානයේ ආචාර්ය එන් එම් පෙරේරා මාවතේ මීටර් 300ක් පමණ ගමන් කළ විට අදළ දේපළ දකුණු පසින් වරිපනම් අංක 60 ඒ හි පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ඉතිරි සියයට අනුව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී, අංක 46/58, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක 011-4218745.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු
කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 077-3181891.

03-186

---

**සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. ජී. එන්. සෙනෙවිරත්න යන අය විසින් ලියා සහතික කරන ලද 2007 ජනවාරි මස 12 දතම හා අංක 255 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇප කොට මෙහි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති දේපළ ඇපයට තබා ගෙන ලබා දුන් ණය මුදල ආපසු ගෙවීම ලා මාජ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදයින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2017 ක් වූ මාර්තු මස 21 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ (1).*- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේපත්තුවේ දෙහිවල -ගල්කිස්ස මහනගර සභා සීමාවන් තුළ ක්වරි පාරේ පිහිටි ගල්වල පාර, වරිපනම් අංක 226/3 සහ 226/3 ඒ (පැරණි අංකය 228/2) දරන ''ඇටිමුදල්දෙල්ගහවත්ත'' යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ධර්මවර්ධන යන අය විසින් සාදන ලද 1994.02.08 දතම හා අංක 1892 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් X වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට (බලයලත් මානක තැන ගාමිණී ඩී. දෙඩන්වල යන අය විසින් 2006.11.28 වැනි දින මායිම් සහ ප්‍රමාණය සනාථ කරන ලද) ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම හතයි පහක් (අ. 0 රූ. 0 පර්. 22.75) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම පහයි හතයි පහ (0.575 හෙක්ටයාර්) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1892 දරන පිඹුරට අනුව වෙලුම/පත්‍ඉරුව එම් 2203/159 යටතේ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

*දේපළ (2).*-එක් ක්වරි පාරේ පිහිටි ගල්වල පාර ''ඇටිමුදල්-දෙල්ගහවත්ත යැයි කියනු ලබන ඉඩමට බලය ලත් මානක තැන එස්. ධර්මවර්ධන යන අය විසින් සාදන ලද 1994.02.08 දතම හා අංක 1892 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් වයි වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට (බලයලත් මානක තැන ගාමිණී ඩී. දෙඩන්වල යන අය විසින් 2006.11.28 දින මායිම් සහ ප්‍රමාණය සනාථ කරන ලද) ප්‍රමාණයෙන් පර්චස් තුනක් (අ. 0 රූ. 0 පර්. 3) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතයි හයක් (0.0076 හෙක්ටයාර්) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1892 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව එම් 3016/07 යටතේ දෙල්කඳ/නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017.01.27 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2017.01.27 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - ගාලු පාරේ දෙහිවල මංසන්ධිය දක්වා ගමන් කොට හිල්වීදියට වමට හැරී ගල්වල (ක්වොරි) හන්දිය (ගල්විහාර පාර වශයෙන් ද හැඳින්වේ.) දක්වා ගමන් කොට එතැනින් වමට හැරී වරිපනම් අංක 226 වශයෙන් හැඳින්වෙන පරිශ්‍රය දක්වා මීටර් 300ක් පමණ ඉදිරියට ගොස් අදළ දේපළ දක්වා දිවෙන අඩි 6ක් පළල පටුමගට වමට හැරීමෙන් ඉඩමට ළඟා විය හැකි ය. මෙම පටුමග කෙළවර දේපළට ඇතුළුවීමට පිය ගැට කිහිපයක් සහ යකඩ ගේට්ටුවක් ද ඇත. (මෙම දේපළට රථවාහන ගමන් කළ හැකි පාරක් තිබී ඇති අතර යාබද ඉඩමේ අයිතිකරු විසින් එය අවුරා ඇත).

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%)ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ත් ඇතුළත සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු කළමනාකරු (ණය අය කිරීම්) සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, අංක 80, නාවල පාර, නුගේගොඩ.

(දුරකථන අංක 2821030, 2821035) ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනට ම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර, කොළඹ 12,
දුරකථන අංක : 0777 - 378441 0714 - 424478
ෆැක්ස් අංකය : 0112 - 509442

03-155

---

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම.

ණය යොමු අංකය : 9678817 සහ 72409222.

නොච්චියාගම මුදිතාගම 1. ආරුමුගම් ජයකුමාර් මයා 2. නදීෂා චතුරංගි සමරසිංහ මිය යන අයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017.01.13 දිනැති අංක 2002 දරන ගැසට් පත්‍රයේ හා 2017 ජනවාරි මස 06 වැනි සිකුරාද දින ''දිනමිණ'' ''ඩේලිනිව්ස්'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2017.03.29 වැනි දින පෙ. ව. 11.00 ට කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සහා සීමාවේ (කඳාන උපකාර්යාලය) අංක 184/ඒ දරන ජයසමරුගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නාගොඩ පිහිටි "අනියකන්ද එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ඊ. විජේසූරිය විසින් සාදන ලද 1986 සැප්තැම්බර් මස 15 දිනැති අංක 2495 දරන පිඹුරෙහි ලොට් 27 ලෙස දක්වා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 17 ද, නැගෙනහිරට : මූණමල්ගහවත්ත නමැති ඉඩම ද, දකුණට : ලොට් 88 පාර ද, බස්නාහිරට : ලොට් 26 ද මායිම්ව එකී අංක 2495 දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් අටක (අ. 0, රූ. 2, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ. මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J /77/69 හි ලියාපදිංචි කර ඇත. මේ සමග මෙයට එම ඉඩමට ඇති පාර භාවිත කිරීමේ අයිතියද ඇත.

එකී ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. අහංගම විසින් මෑතකදී සාදන ලද 1992 නොවැම්බර් මස 5 දිනැති අංක 4101 දරන මැනුම් පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී ජාඇල ප්‍රාදේශීය සහා සීමාවේ (කඳාන උපකාර්යාලය) නාගොඩ පිහිටි අනියකන්ද පාරේ වරිපනම් අංක 70/3 දරන "අනියකන්ද එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. අහංගම විසින් සාදන ලද 1992 නොවැම්බර් මස 05 දිනැති අංක 4101 දරන පිඹුරෙහි ලොට් 27 ලෙස දක්වා විස්තර කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : අංක 2405 පිඹුරෙහි ලොට් 17 ද, නැගෙනහිරට : මූනමල්ගහවත්ත ද, දකුණට පාර : (අංක 2945 දරන පිඹුරෙහි ලොට් 88) ද, බස්නාහිරට : අංක 2495 දරන පිඹුරෙහි ලොට් 26 ද මායිම්ව එකී අංක 4101 දරන රූඩ් දෙකයි පර්චස් අටක (අ. 0, රූ. 2, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. බී. ඩබ්ලිව්. ඩී. කේ. රළපනාව,
කළමනාකරු.

ලංකා බැංකුව,
නොච්චියාගම.

03-157

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

### හලාවත දිසා අධිකරණයේ දී ය

නඩු අංකය : 4277/12/MB
ස්වභාවය : උකස්කරය
මුදල : රු. 39,22,526.40

හලාවත, කොළඹ පාරේ අංක 52 දරන ස්ථානයේ ''හලාවත ශාඛාව'' යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තාවූ කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී

.......................පැමිණිලිකරු.

එදිරිව

හලාවත, ලන්සියාවත්තේ , අංක 45 දරන ස්ථානයේ වර්ණකුලසූරිය එඩ්ගාර් ජෙරී ද මැල්.

.........................විත්තිකරු.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2015 ක් වූ මාර්තු මස 09 වැනි දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි පැමිණිලිකරුගේ වාසියට සහ ඉහත නම් සඳහන් විත්තිකරුට විරුද්ධව ඇතුළත් කර ඇත.

ඒ අනුව ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට

(අ) රු. 19,66,650 ක මුදලක් සහ රු. 19,55,876.40 ක තවත් මුදලක් ද යනුවෙන් එකතුව රු. 39,22,526.40ක් වන්නාවූ මුදලක් සහ එකී රු. 19,66.650 ක මුදල මත 2011 ජූලි මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට සියයට 22 බැගින් පොළිය ද ගෙවිය යුතු බවට මෙයින් නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

(ආ) තවද, ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට අධිකරණයේ නිලධාරියකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන මෙම නඩුවේ නඩු ගාස්තු ගෙවිය යුතු බවට ද, මෙයින් වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

(ඇ) තවද, එකී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා පැමිණිල්ලේ සහ මෙහි වූ උපලේඛනයෙහි විස්තර කර ඇත. ඉඩම බන්ධනය වී ඇති බවට සහ ඇස්කිසි කළහැකි බවටද මෙයින් වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2015ක් වූ මාර්තු මස 09 වැනි දින හලාවත දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී, වර්ෂ 2017ක් වූ මාර්තු මස 31 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත උතුරු පිටිගල් කෝරළේ මුන්නේශ්-වරම් පත්තුවේ කාක්කපල්ලිය ග්‍රාමයේ පිහිටි යාය ඉඩම නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු තැන්පත් එම්. එම්. පී. ඩන්ස්ටන් විසින් මැන සාදන ලද අංක 5681 සහ 2007.03.11 වැනි දින දරන සැලැස්මේ නිරූපිත අංක 2 බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති එම බෙද වෙන් කොට සීමා නිර්ණය කර ඇති බිම් කොටස එහි පිහිටි සියල්ල සහිතව ඊට මායිම් උතුරට : වැවේ සිට මහපාර දක්වා වැටී ඇති ප්‍රාදේශීය සභා පාර, නැගෙනහිරට : අංක 5681 දරන එකී සැලැස්මේ අංක 3 බිම් කැබැල්ල දකුණට: එම්. එම්. එස්. අප්පුහාමිගේ ඉඩම, බස්නාහිරට : අංක 5681 දරන එකී සැලැස්මේ අංක 1 බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය රූඩ් එකක් (අ. 0 රූ. 1 පර්. 0) වේ.

එකී ඉඩම වූ කලී කාක්කපල්ලිය ග්‍රාමයේ පිහිටි එකී යාය ඉඩම නමැති ඉඩමේ එකී අංක 5681 දරන සැලැස්මේ අංක 1 සහ අංක 2 ඒකාබද්ධ බිම් කොටස්වලින් බෙද වෙන් කළ කොටස එහි පිහිටි සියල්ල සහිතවයි. එක දේපළක් බවට පත්ව ඇති එකී අංක 1 සහ අංක 2 ඒකාබද්ධ බිම් කොටස් දෙකට මායිම් උතුරට : පාර, නැගෙනහිරට : එකී අංක 5681 දරන සැලැස්මේ අංක 3 බිම් කැබැල්ල, දකුණට : එම් . එම්. එස්. අප්පුහාමිගේ ඉඩම බස්නාහිරට : ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා විසින් සාදන ලද අංක 772 දරන සැලැස්මේ අංක 8 බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය අක්කර එකක් (අ. 1 රූ. 0 පර්. 0) වේ. හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව සී 192/199 සහ ඩී 22/106 යටතේ ලියාපදිංචි වී ඇත.

*ඉඩමට පිවිසීම.* - කොළඹ සිට හලාවත පාරේ කාක්කපල්ලිය නගරයට පැමිණ එතැනින් වමට ඇති පාසැල් පාරේ මීටර් 100ක් පමණ ගියවිට අදාළ දේපළ එම පාරේ වම්අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(01) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%), (2) නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තු රු. 10,500, (03) සියලුම ප්‍රචාරක වියදම්, (04) වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු, (05) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු , (06) ලිපිකරු බෙරකරු හා සෝෂක ගාස්තු රු. 4,500, (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30ක් ඇතුළත දී හලාවත දිසා අධිකරණයේ ඉහත

සඳහන් නඩුවට තැන්පත් කර යුතු ය. ඔප්පු පරීක්ෂා කිරීමට සහ වෙනත් විස්තර සඳහා පහත අයගෙන් විමසන්න.

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වැනි මහල,
මරදාන පාර, කොළඹ 10.
දුරකථන අංක 011- 2672262/011- 2672263
ෆැක්ස් අංකය : 011-2683073.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්,
වානිජ මහාධිකරණය සහ කොළඹ දිසා
අධිකරණයේ සහ ගාල්ල
දිසා අධිකරණයේ බලයලත් වෙන්දේසිකරු
රාජ්‍ය හා වාණිජ බැංකු.

අංක 200, 2 වැනි මහල, හල්ෆ්ඩෝප් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 011-2445393/011-2396520.
ඊමේල් : senaservice@sltnet.lk

03-127

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - මාතලේ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### පළමු උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, තවලංක්ඹය දිශාවේ අංක ඊ 357 බී දරන ග්‍රාම නිලධාරි වසමේ උකුවෙල ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මාතලේ මැදසිය පත්තුවේ උකුවෙල පිහිටි උකුවෙලවත්ත (කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජී. ඩබ්. ගිරාගම විසින් 2006 දෙසැම්බර් මස 30 වැනි දින සාදන ලද අංක 6331 දරන පිඹුරේ ලොට් 2 දරන

ප්‍රමාණය : පර්චස් දහසයක් (අ. 0 රූ. 0 පර්. 16) විශාල ඉඩම ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

### දෙවන උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ උකුවෙල ඊ 355 දරන ග්‍රාම නිලධාරි වසමේ දකුණු මාතලේ මැදසිය පත්තුවේ උකුවෙල පිහිටි උකුවෙලවත්ත නමැති ඉඩමෙන් බෙදු වෙන් කොට ඇති ඉඩමට මාතලේ බලයලත් මිනින්දෝරු ඒ. ජී. ඩබ්. ගිරාගම විසින් 1991 සැප්තැම්බර් මස 07 වැනි දින මැන සාදන ලද අංක 2329/2 දරන

ප්‍රමාණය පර්චස් දහය (අ. 0 රූ. 0 පර්. 10) විශාල ඉඩම ඒ තුළ පිහිටි වගාවන් සහ සියලුදේත් සමග වේ.

### තෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, තවලංක්ඹය දිශාවේ අංක ඊ 357 බී දරන ග්‍රාම නිලධාරි වසමේ උකුවෙල ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මාතලේ මැදසිය පත්තුවේ උකුවෙල පිහිටි උකුවෙලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ.ජී. ඩබ්. ගිරාගම විසින් 2006 දෙසැම්බර් මස 30 වැනි දින සාදන ලද අංක 6331 දරන පිඹුරේ ලොට් 1

ප්‍රමාණය පර්චස් අටක් (අ. 0 රූ. 0 පර්. 8) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියලුදේත් සමග වේ.

හීන්කෙන්ද මුදලිගේ පද්මා පුෂ්පාංජලී හීන්කෙන්ද හෙවත් පද්මා පුෂ්පාංජලී හීන්කෙන්ද හෙවත් හීන්කෙන්ද මුදලිගේ දෝන පද්මා පුෂ්පාංජලී හීන්කෙන්ද සහ තිලකරත්න ශ්‍රී ගාමිණී කරුණාතිලක යන අය ණයකරුවන් ලෙසද හීන්කෙන්ද මුදලිගේ පද්මා පුෂ්පාංජලී හීන්කෙන්ද හෙවත් පද්මා පුෂ්පාංජලී හීන්කෙන්ද හෙවත් හීන්කෙන්ද මුදලිගේ දෝන පද්මා පුෂ්පාංජලී හීන්කෙන්ද උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත 1, 2, සහ 3 උපලේඛනවල සඳහන් දේපළ,

1 වන උපලේඛනයේ සඳහන් දේපළ
වර්ෂ 2017ක් වූ මාර්තු මස 24 වැනි දින ප. ව. 1.00 ට

3 වන උපලේඛනයේ සඳහන් දේපළ
වර්ෂ 2017ක් වූ මාර්තු මස 24 වැනි දින ප. ව. 1.15 ට

2 වන උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2017ක් වූ මාර්තු මස 24 වැනි දින ප. ව. 1.30 ට

ඉහත සඳහන් ස්ථානවලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.11.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත් පත් බලන්න. විකිණීම පිළිබඳව දැන්වීම සඳහා 2017.03.03 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද 2017.03.06 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම. - (1, 2 සහ 3 උපලේඛන)

මාතලේ නගරයේ සිට නුවර පාරේ කි. මී. 4ක් පමණ ගිය විට එල්වල හංදිය හමුවේ. එතැනින් ඇති වත්තේගම පාරේ කිලෝමීටරයක් පමණ ගියවිට තවලන්කෝය කි. මී. 12 කණුව හමුවේ. එතැන් සිට මීටර් 125ක් පමණ ඉදිරියට ගිය විට අදාළ දේපළ එම පාරේ දකුණු අත පැත්තේ ඉදිරියෙන් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (6) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතු ය, (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මාතලේ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත අය විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 200, 2 වැනි මහල, උසාවිය පාර,
කොළඹ 12.
දුරකතන/ෆැක්ස් අංක : 011-2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 70, රජ වීදිය,
මාතලේ.
දුරකතන අංක 066-2231880/066-2222485,
ෆැක්ස් අංකය : 066-2222204.

03-128

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳව දැන්වීමයි

ණය අංකය : 10/001/01/00221BTA/089

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.06.12 වැනි දින ගැසට් පත්‍රයේ සහ 2016.10.07 වැනි දින දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකරගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි පදිංචි බලයලත් වෙන්දේසිකාර මර්වින් සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2017.03.17 වැනි දින පෙරවරු 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සහ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි මීගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වටරැක සහ ගැහැනුවල යන ගම්වල පිහිටි ''කරලමුහේන, කහටගහවත්ත, අග්ගොන්නදෙණිය'' සහ ''ඕවිටබිම'' නමැති ඉඩමට 1998.11.01 වැනි දින බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා මහතා විසින් මැන සකසන ලද අංක 1794 B දරන පිඹුරේ කැබලි අංක B ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 20.6 ක් වූ බිම් කොටස හා ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියලු දේ ද වේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන් 461/93 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට සහ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි මීගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වටරැක සහ ගැහැනුවල යන ගම්වල පිහිටි ''කරලමුහේන, කහටගහවත්ත, අග්ගොන්නදෙනිය සහ ''ඕවිටබිම''නමැති ඉඩමට 1998.11.02 වැනි දින බලයලත් මිනින්දෝරු බී.එච්. ඒ ද සිල්වා මහතා විසින් මැන සකසන ලද අංක 1794 C දරන මිනුම් පිඹුරේ කැබලි අංක C ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 33ක් වූ බිම් කොටස හා ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියලු දේ ද වේ. මෙම ඉඩම් අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන්. 438/121 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ මැද පත්තුවේ, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සීතාවක ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ගලගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගලගෙදර ග්‍රාමයෙහි පිහිටි අවිස්සාවේල්ල පාර, ගලගෙදර වරිපනම් අංක 207/4 දරන ''මීපේවත්ත'' නමැති ඉඩමට 2011.10.05 වැනි දින බලයලත් මිනින්දෝරු එම්. ආර්. ගිනිගේ මහතා විසින් මැන සකසන ලද අංක 415 දරන මිනුම් පිඹුරේ කැබලි අංක A ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 1, පර්. 2.20 ක් වූ බිම් කොටස හා ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියලු දේ ද වේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එන් 426/204 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගයන් ලෙස බලයලත් මිනින්දෝරු බී.එච්. ඒ. ද සිල්වා මහතා විසින් 1998.07.04 වැනි දින මැන සකසන ලද අංක 1794 දරන මිනුම් පිඹුරෙහි කැබලි අංක ආර් 1 (අඩි 20 පළල පාර) හා කැබලි අංක ආර් 4 (අඩි 10 පළල පාර) මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිළිවෙලින් පත් ඉරු අංක එන් 379/291 සහ එන් 438/56 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. එම්. දයාසිංහ මයා,
සාමාන්‍යාධිකාරී.

2017 පෙබරවාරි මස 14 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

03-123

---

## සීමාසහිත ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක්

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය

රත්නපුර පානදුර පාරේ වරිපනම් අංක 37 ඒ දරන පරිශ්‍රයේ පිහිටි රූඩ් 02 පර්චස් 35.75 විශාලැති අගනා දේපලක්.

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ දකුණු උඩපත්තුවේ වෙරළුපාන කොට්ඨාසයේ රත්නපුර මහ නගර සභා සීමාවේ පිහිටි ''මදුරාවෙළ ඕවිට'' සහ ''මදුරාවෙළ හේන'' (කොටසක්) යනුවෙන් හඳුන්වන ඉඩමෙහි බලයලත් මානක එම්. වර්ණසූරිය විසින් සාදන ලද 2006.07.21 දිනැති අංක 802 ඒ 1 දරන පිඹුරෙහි කැබලි අංක 1 ලෙස ලකුණු කර ඇති බෙද වෙන් කර සීමා නිර්ණය කර ඇති ඉඩම සහ එහි පිහිටි පස ගහකොළ වැවිලි ගොඩනැගිලි ඇතුළු සෑම දේත්.

සීමාසහිත ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. පී. එන්. සෙනෙවිරත්න විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2006 ඔක්තෝබර් මස 09 දිනැති අංක 224 දරන උගස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අත්තනායක මොහොට්ටාළලාගේ ලක්සිරි ගාමිණී අත්තනායක ණයකරු හැටියට පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2017ක් වූ මාර්තු මස 16 වැනි දින පෙ. ව. 11.00 කණිසමට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2017 ජනවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා රජයේ ගැසට් පත්‍රය ද, ''ද අයිලන්ඩ්'', ''දිවයින'' සහ ''තිනකුරල්'' පුවත්පත් බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- රත්නපුර හෝරා ස්ථම්භය අසළ සිට කොළඹ පාර ඔස්සේ මොරගහයට දක්වා මීටර් 300ක් පමණ ගමන් කොට එතැන් සිට වමට පිහිටා ඇති පානදුර පාරට හැරී මීටර් 400ක් පමණ 67 වන කි මී. කණුව පසුකර ගමන් කිරීමෙන් පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මිලෙන් 10% ක මුදලක් ද, (2) පළාත් පාලන ආයත ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 3,000ක් ද, ගෙවිය යුතු වන අතර විකුණුම් මිළේ පරිශේෂය වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ඉහත කී බැංකුවේ තැන්පත් කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා නුගේගොඩ නාවල පාරේ අංක 80 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් හි කළමනාකරු ණය ආපසු අයකිරීම් ගෙන් විමසන්න.

දුරකථන අංක 011 - 2821030, 011-2821035.

ෆැක්ස් අංකය : 011-2821031.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංකෘ2873656, 0777 - 672082, ෆැක්ස් අංකය : 2871184.

03-68

---

## සීමාසහිත ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක්

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය

මිරිස්ස පිහිටි රූඩ් 01, පර්චස් 1.75 විශාලැති අගනා දේපලක්

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ මිරිස්සේ පිහිටි ''බෝදහෙන්නදිගේ කොරටුව නොහොත් පදිංචි ගෙදරවත්ත කැබැල්ල'' යනුවෙන් හඳුන්වන ඉඩමෙහි බලයලත් මානක එන්. විජේවීර විසින් සාදන ලද 1992.03.20 දිනැති අංක 4353 දරන පිඹුරෙහි කැබලි අංක 1 ලෙස ලකුණු කර ඇති ප්‍රමාණයෙන්

රුඩ් 01යි, පර්චස් 1.75ක් විශාලැති බෙද වෙන් කළ ඉඩම සහ එහි පිහිටි පස ගහකොළ වැව්ලි ගොඩනැගිලි ඇතුළු සැම දේත්.

සීමාසහිත ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් අනුෂා නිරංජලා ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012 අගෝස්තු මස 03 දිනැති අංක 1742 දරන උගස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේවීර ගුණරත්න මහවිදාන මුහම්දිරම්ගේ ජයන්ත ණයකරු හැටියට පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ 2017 ක් වූ මාර්තු මස 17 වැනි දින පෙ. ව. 11.30 කණිසමට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2016 නොවැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා *රජයේ ගැසට් පත්‍රය* ද, ''ද අයිලන්ඩ්'', ''දිවයින'' සහ ''තිනකුරල්'' පුවත්පත් බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- මාතර නගරයේ සිට මිරිස්ස නගරය දක්වා ගාලුපාර ඔස්සේ මිරිස්ස හන්දිය දක්වා ගමන් කරන්න. මෙම දේපළ පාරේ වම් පසින් පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මිලෙන් 10% ක මුදලක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 3,000ක් ද, ගෙවිය යුතු වන අතර විකුණුම් මිළේ පරිශේෂය වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ඉහත කී බැංකුවේ තැන්පත් කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා නුගේගොඩ නාවල පාරේ අංක 80 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් හි කළමනාකරු ණය ආපසු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක : 011 - 2821030, 011-2821035.

ෆැක්ස් අංකය : 011-2821031.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 - 672082, ෆැක්ස් අංකය : 2871184.

03-67

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) … … | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) … … | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) … … … … … … … … | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) … … … … … … … … | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)… … | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය… … … … … … … … | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 00 | 60 00 |
| III වැනි ඡේදය … … … … … … … | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 00 | 120 00 |
| II වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| III වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 00 | 60 00 |
| V වැනි කොටස … … … … … … … … | 123 00 | 60 00 |
| VI වැනි කොටස … … … … … … … … | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **මාර්තු** | 2017.03.03 | සිකුරාදා | 2017.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.10 | සිකුරාදා | 2017.02.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.03.17 | සිකුරාදා | 2017.03.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.24 | සිකුරාදා | 2017.03.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.31 | සිකුරාදා | 2017.03.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2017.04.07 | සිකුරාදා | 2017.03.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.12 | බදාදා | 2017.03.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.21 | සිකුරාදා | 2017.04.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.28 | සිකුරාදා | 2017.04.12 | බදාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2017.05.05 | සිකුරාදා | 2017.04.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.12 | බදාදා | 2017.04.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.19 | සිකුරාදා | 2017.05.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.26 | සිකුරාදා | 2017.05.12 | බදාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.